# 8. පිරිසිදු ව සිටිමු

අපි පිරිසිදු ව සිටිමු. පිරිසිදු ව සිටින අයට අල්ලාහ් කැමැති ය. අන් අය ද කැමැති ය. අපගේ ශරීරය පිරිසිදු ව තබා ගත යුතු ය. ඒ සඳහා ස්නානය කළ යුතු ය. සිකුරාදා දිනයන්හි නෑම සුන්නත් වේ. අපගේ ඇඳුම් පිරිසිදු ව තබා ගත යුතු ය. නිතර ම පිරිසිදු ව සිටින ලෙස ඉස්ලාම් අණ කර ඇත.





3 - රජය මුද්‍රණ. - 120277

අප වාසස්ථානය පිරිසිදු ව තබා ගත යුතු ය. අප භාවිත කරන බඩු බාහිරාදිය ද පිරිසිදු ව තබා ගත යුතු ය. කොට්ට, ඇඳ ඇතිරිලි, පාවහන්, පනා වැනි දේ පිරිසිදු ව තබා ගත යුතු ය. අපද්‍රව්‍ය, අපිරිසිදු ජලය නරක් වූ දැ යනාදිය නිවසේ එකතුවීමෙන් දුගඳ හමයි. මෙයින් මැසි, මදුරුවෝ බෝවෙති. ලෙඩ රෝග පැතිරෙයි. බරකත් අඩුවෙයි. මලායිකාරවරු නොපැමිණෙති. එම නිසා අපගේ ශරීරය, ඇඳුම්, නිවාස සහ පරිසරය පිරිසිදු ව තබා ගත යුතු ය.

## පැවරුම්

**වරහන් තුළ ඇති වඩාත් ම සුදුසු වචන යොදා එම වාක්‍ය ලියන්න.**

1. පිරිසිදු ව සිටින අයට අල්ලාහ් (කැමැති/අකැමැති) ය.
2. සිකුරාදා දිනයන්හි නෑම (යහපත්/අයහපත්) පුරුද්දකි.
3. නිතර ම පිරිසිදු ව සිටීම (හොඳ/නරක) පුරුද්දකි.
4. අපද්‍රව්‍ය, අපිරිසිදු ජලය, කුණු යනාදිය නිසා ලෙඩ රෝග (පැතිරෙයි/නො පැතිරෙයි)
5. පිරිසිදු ස්ථානවල බරකත් (අඩු/වැඩි) වේ.
6. අපගේ ශරීරය සහ ඇඳුම් පැළඳුම් නිතර (පිරිසිදු ව තබා ගත යුතු ය/පිරිසිදු ව තබා ගැනීම අනවශ්‍ය ය)